# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 41 දරන ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීම වැළැක්වීමේ පනත

---

**[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 09 වන දින.]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2000 අගෝස්තු මස 11 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 5.75 යි.** තැපැල් ගාස්තුව : රු. **3.50 යි.**

# 2000 අංක 41 දරන ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීම වැළැක්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 09 වන දින.]

එල්. ඩී.– ඕ. 19/99

**ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීමට එරෙහිව වූ සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

පූර්විකාව.

ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීමට එරෙහිව වූ සම්මුතිය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් එක් දහස් නවසිය හැත්තෑ නවයේ දෙසැම්බර් මස දාහත් වන දින සම්මත කර ගනු ලැබ ඇති හෙයින් ද :

ඉහත කී සම්මුතියට ශ්‍රී ලංකාව, එකඟත්වය ප්‍රකාශ කිරීමට අදහස් කරනු ලබන හෙයින් ද :

ඉහත කී සම්මුතිය යටතේ වූ ශ්‍රී ලංකාවේ වගකීම බලාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන සැලැස්වීමට අවශ්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2000 අංක 41 දරන ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීම වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් එක්දහස් නවසිය හැත්තෑ නවයේ දෙසැම්බර් මස දහත් වන දින සම්මත කරගන්නා ලද (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීමට එරෙහිව වූ ජාත්‍යන්තර සම්මුතිය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වන දිනය වශයෙන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, සහතික කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

සම්මුතියට අයත් රාජ්‍යයන්.

2. සම්මුතියට පාර්ශවකරුවන් වන රාජ්‍යයන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් කලට සහතික කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ නියමයක් කරන ලද්දේ යම් රාජ්‍යයක් සම්බන්ධයෙන් ද, ඒ රාජ්‍යය මෙහි මින් මතු "සම්මුතියට අයත් රාජ්‍යයක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීම වරදක් බව.

**3.** (1) ප්‍රාණ ඇපකරුවකු මුදාහැරීම සඳහා ප්‍රකාශිත හෝ ව්‍යංජිත කොන්දේසියක් ලෙස යම් ක්‍රියාවක් කිරීම හෝ කිරීමෙන් වැළකී සිටීමට තුන්වන පාර්ශවකරුවකුට, එනම්, යම් රාජ්‍යයකට, ජාත්‍යන්තර අන්තර් රාජ්‍යමය සංවිධානයකට, යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට බල කිරීම පිණිස (මෙහි මින් මතු "ප්‍රාණ ඇපකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් තැනැත්තකු –

(අ) අල්ලා ගන්නා හෝ රඳවා තබා ගන්නා ; සහ

(ආ) මරණ බවට හෝ තුවාල සිදු කරන බවට හෝ දිගටම රඳවා ගනු ලබන බවට තර්ජනය කරන,

යම් තැනැත්තෙක්, ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීමේ වරදට, මෙම පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

(2) ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීමේ වරද –

(අ) සිදු කිරීමට තැත් කරන්නා වූ ;

(ආ) සිදුකිරීමෙහි ලා ආධාර දීම හෝ අනුබල දීම කරන්නා වූ,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

මේ උපවගන්තියේ "අනුබල දීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන හා 101 වන වගන්තිවල ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබ මහාධිකරණය විසින් නඩු විභාගයෙන් පසුව වරදකරු කරනු ලබන තැනැත්තකුට, ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ වූ වරදවල් මහාධිකරණය විසින් විභාග කළ යුතු බව.

**4.** (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද මේ පනත යටතේ වූ වැරදි විභාග කිරීම සඳහා කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ මහාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාත සඳහා වූ මහාධිකරණයට හෝ අනන්‍ය අධිකරණ බලය ඇත්තේ ය.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දරපණ පනත සංශෝධනය කිරීම.

**6.** (1) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දරපණ පනතේ උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන් ඒ පනතේ, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(44) ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීම".

(2) මේ පනතේ උපලේඛනයේ දැක්වෙන විස්තරයට ඇතුළත් වන්නා වූ වරදකට, චෝදනා කරනු ලැබූ හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තකු උද්දරපණය කිරීම සඳහා සම්මුතියට අයත් රාජ්‍යයක් විසින් හෝ ඒ රාජ්‍යය වෙනුවෙන් හෝ, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දරපණ පනත යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දරපණ පනත ඒ ඉල්ලීමට අදාළ කිරීමේ දී, ඒ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල ඇතුළත් වන "වර්ගය, ආගම, ජාතිය හෝ දේශපාලන මත" යන වචන වෙනුවට "වර්ගය, ආගම, ජාතිය, ජනවාර්ගික පැවැත්ම හෝ දේශපාලන මත" යන වචන ආදේශකර ඇත්තා සේ බලාත්මක විය යුතු ය.

සම්මුතියට අයත් රාජ්‍යයන් සමග දැනට පවත්නා උද්දරපණ වැඩපිළිවෙලවල් මගින් උපලේඛනයේ සඳහන් වැරදි සඳහා විධිවිධාන සලස්වනු ලබන බව සලකනු ලැබිය යුතු බව.

**7.** මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ සම්මුතියට අයත් යම් රාජ්‍යයක් අතර උද්දරපණ වැඩ පිළිවෙලක් බලාත්මකව පවත්නා අවස්ථාවක දී ඒ වැඩ පිළිවෙලට ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දරපණ පනතේ කාර්ය සඳහා, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති වැරදි සම්බන්ධයෙන් උද්දරපණය කිරීම සඳහා විධිවිධාන ද ඇතුළත් වන්නේ යයි සලකනු ලැබිය යුතු ය.

උපලේඛනයෙහි සඳහන් වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ සම්මුතියට අයත් ඇතැම් රාජ්‍යයන් අතර උද්දරපණ වැඩපිළිවෙලක් ලෙස අමාත්‍යවරයා විසින් සම්මුතිය සලකනු ලැබිය හැකි බව.

**8.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ සම්මුතියට අයත් යම් රාජ්‍යයක් අතර උද්දරපණ වැඩපිළිවෙලක් නොපවත්නා අවස්ථාවක දී, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දරපණ පනතේ කාර්ය සඳහා, සම්මුතිය, මේ පනතේ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති වැරදි සම්බන්ධයෙන් උද්දරපණය කිරීම සඳහා විධිවිධාන සලස්වමින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඒ සම්මුතියට අයත් රාජ්‍යය සමග ඇතිකර ගන්නා ලද උද්දරපණ වැඩ පිළිවෙලක් ලෙස සලකනු ලැබීමට, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කටයුතු සැලැස්විය හැකි ය.

9. සාක්ෂි සහ ප්‍රකාශ ගැනීමට හා සිතාසි භාරදීමට අදාළ සහායවීම ද ඇතුළුව, 3 වන වගන්තිය යටතේ වූ වරදක් හෝ මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් වරදක් හෝ පිළිබඳව විභාග කිරීම සහ ඒ පිළිබඳව නඩු පැවරීම සඳහා අවශ්‍ය වන සියලු සහායවීම්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්මුතියට අයත් රාජ්‍යයකට ලබා දිය යුතු අතර, එවැනි සියලු සහායවීම් අමාත්‍යවරයාගේ මාර්ගයෙන් සම්මුතියට අයත් රාජ්‍යයකින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

සම්මුතියට අයත් රාජ්‍යයන්ට සහාය වීම.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

## උපලේඛනය (7, 8 වගන්ති)

(1) ප්‍රාණ ඇපකරුවකු මුද හැරීම සඳහා ප්‍රකාශිත හෝ ව්‍යංජිත කොන්දේසියක් ලෙස යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට යම් රාජ්‍යයකට, ජාත්‍යන්තර අන්තර් රාජ්‍යමය සංවිධානයකට, යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට බල කිරීම පිණිස, යම් තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකු සිය ග්‍රහණයට ගැනීම සහ රඳවා ගැනීම සහ (මේ උපලේඛනයේ 'ප්‍රාණ ඇපකරු' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ වෙනත් තැනැත්තා මරණ බවට හෝ ඒ තැනැත්තාට තුවාල සිදු කරන බවට හෝ ඒ තැනැත්තා දිගටම රඳවා ගෙන සිටින බවට, තර්ජනය කිරීම.

(2) (1) වන ඡේදයේ සඳහන් කරන ලද වරද සිදු කිරීමට තැත් කිරීම.

(3) (1) වන ඡේදයේ සඳහන් කරන ලද වරද සිදු කිරීමට ආධාර සහ අනුබල දීම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.